# ඓතිහාසික පැල්මඩුල්ල ධර්ම සංගායනාව පිළිබඳ අධ්‍යයනයක්

නෙල්ලිවල මෙත්තානන්ද හිමි[1]
අරුණ ශාන්ත වල්පොල[2]

වර්ෂ 1867 දී රත්නපුර දිස්ත්‍රික්කයේ පැල්මඩුල්ල සුදර්ශන ධර්මශාලාවේදී පැවැත්වූ ඓතිහාසික ධර්ම සංගායනාව පැල්මඩුල්ල ධර්ම සංගායනාව ලෙස හැඳින්වේ. මෙය ලංකාවේ පැවැත් වූ දෙවන ධර්ම සංගායනාවයි. ථේරවාදීන්ගේ හයවන ධර්ම සංගායනාව ලෙස ද හැඳින්වෙන මෙහි මූලිකත්වය ගෙන ක්‍රියාකර ඇත්තේ හික්කඩුවේ ශ්‍රී සුමංගල මා හිමියන් සහ ලංකාගොඩ ධීරානන්ද හිමිවරුන් ය. බෞද්ධ ධර්ම සංගායනා ඉතිහාසයේ ගිහියෙක් සංගායනාවකට ප්‍රථමවරට සම්බන්ධ වූයේ ද මෙහිදී ය. ඒ බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පණ්ඩිතුමන් ය. මෙම සංගායනාවේ ප්‍රධාන දායකවරයා වූයේ එවකට සබරගමුව මහ සමන් දේවාලයේ බස්නායක නිලමේ ලෙස කටයුතු කළ ඉද්දමල්ගොඩ නිලමේ තුමන් ය. සංගායනාව පැවැත්වීම සඳහා ඉතා අලංකාර සුදර්ශන යැයි නම් ලත් ධර්ම ශාලාවක් ද ඉදිකර තිබේ. සංගායනාව කිරීමේ අරමුණ වූයේ අලුවිහාර සංගායනාවෙන් පසු කාලීනව අව්‍යක්ත ලේඛකයන් අතින් අත ලිවීමේදී සිදු වී ඇති අක්ෂර, පද ආදියෙන් යුක්ත වූ ත්‍රිපිටකය ශුද්ධ කිරීමයි. සංගායනාවට සහභාගී වූ භික්ෂූන් විසින් සංගෘහිත සියලු ත්‍රිපිටක පොත් වලානේ සිද්ධාර්ථ නාහිමියන් ඉදිරියේ කියවා අවසන් ශුද්ධිය කළ යුතුවිය. ඇතැම් විචාරකයන්ට අනුව මෙම සංගායනාවේදී විනය පිටකය පමණක් සංගායනා කර ඇතැයි පැවසුව ද සුමංගල චරිතයට අනුව පූර්ණ ත්‍රිපිටක සංගායනාවක් මෙහි සිදුකර ඇත. මාස හයක පමණ කාලයක් එකට එක්වී විනය පිටකය සංගායනා කළ අතර පසුව පොත් බෙදාගෙන ගොස් තමතමන්ගේ විහාරස්ථානවල දී ශුද්ධ කොට නැවත එක්වී සාකච්ඡා කර ඇත. මෙම සංගායනාවෙන් පසු ලියූ ත්‍රිපිටක පොත් වර්තමානය වන විට පැල්මඩුල්ල පුරාණ දාගැබ් විහාරයේ සහ ජාතික කෞතුකාගාරයේ දක්නට ලැබේ. නමුත් ප්‍රධාන අනුග්‍රාහකයාගේ නියමය වී ඇත්තේ සුදර්ශන ධර්මශාලා විහාරයේ සකස් කරන පුස්තකාලයෙහි එම පොත් තැම්පත් කර තබා සියලු දෙනාට ත්‍රිපිටකය අධ්‍යයනයට අවස්ථාව ලබා දීමයි. වත්මන් බොහෝ උගතුන් නාමිකව පමණක් අසා දැන ඇති ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් වූ පැල්මඩුල්ල ධර්ම සංගායනාව පිළිබඳ අධ්‍යයනය කිරීම සහ එම අධ්‍යයනය තුළින් රැස්කරගත් තොරතුරු පිළිබඳ සංවාදයක් ගොඩ නැගීම සහ ඒ තුළින් තවදුරටත් මේ පිළිබඳ අධ්‍යයනයට උනන්දුව ඇති කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණයි.

**ප්‍රමුඛ පද:** සංගායනාව, ත්‍රිපිටකය, ඓතිහාසික, අව්‍යක්ත, ශුද්ධිය, අධ්‍යයනය

---

1 සහය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය